**41 පිටෙන්**

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂව දැනුවත් කිරීමට ලලිත් අලහකෝන් මහතා කටයුතු කළේය. ඉන් නොනැවතී සිද්ධිය පිළිබඳ දේශපාලනඥයන්, රාජ්‍ය නොවන සංවිධාන, විදෙස් තානාපති කාර්යාල, දෙස් විදෙස් මාධ්‍ය ආයතන දැනුවත් කිරීමට ද පිරිස කටයුතු කළහ. ක්‍රිෂාන්ත ඇමැති කරු ජයසූරියට දුරකථන ඇමතුමක් ගනිත්දී රෑ එකොළහ පසුව තිබුණ මුත්, එවකට රාජ්‍ය පරිපාලන ඇමැතිවරයා ලෙස කටයුතු කළ, ඒ මහතා දුරකථනයට එකවර පැමිණියේය. කරූ ජයසූරිය හා ක්‍රිෂාන්ත සමීප හිතවතුන් වනමුත්, රිවිර ප්‍රධාන විධායක නිලධාරියාගේ හඬ තුළ වූයේ සෑහෙන වේගවත් බවකි. " සර්, වගේ ශිෂ්ටසම්පන්න මිනිහෙක්, මේ වගේ ආණ්ඩුවක ඇමැතිකමක් දරන්නෙ කොහොමද?" කියමින් සිදුවීම පැහැදිලි කළ ක්‍රිෂාන්ත වහා මේ පිළිබඳ මැදිහත් වීමක් සිදුකරන ලෙස ඇමැතිවරයාගෙන් ඉල්ලා



සිටියේය. ක්‍රිෂාන්ත ඇමතුම විසන්ධි කළ වහාම ජයසූරිය මහතා ජනාධිපති මහින්ද රාජපක්ෂට ඇමතුමක් ගත්තේය. " ජනාධිපතිතුමා නින්දට ගිහින් ඉන්නෙ. ඇයි සර් හදිස්සියක්ද" දුරකථනය ගත් පුද්ගලයා විමසුවේය. හදිසි කාරණයක් දැනුම් දීමට ජනාධිපතිවරයාට කථා කිරීමට අවශ්‍ය බවත් ඒ නිසා වහා ඔහුව සම්බන්ධ කරන ලෙසත් ඇමැතිවරයා දැනුම් දුන් පසු සම්බන්ධතාව සකසන ලදී. "මෙහෙම දෙයක් වෙලා තියෙනවා. ආණ්ඩුවේ ඇමැතිවරයෙක් විදිහට ඇත්තටම මටත් මේ ගැන ලැජ්ජයි. මේ ගැන විවිධ ආරංචි යනවා. වහාම මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් අරන් මේ මනුස්සයව හොයලා දෙන්න මැදිහත් වෙන්න" ජයසූරිය මහතා පවසත්දී සියල්ල නිහඬව අසා සිටි රාජපක්ෂ මහතා මේ ගැන වහා සොයා බලන බවට පොරොන්දු විය.

ජයසූරිය මහතාගේ ඇමතුම ලැබුණු පසු රාජපක්ෂ ජනාධිපතිවරයා ආරක්ෂක ලේකම්වරයා ඇතුළු ඉහළ නිලධාරීන් කිහිපදෙනෙකු සමඟ මේ සිදුවීම පිළිබඳ කථා කළේය. ඔහු ලලිත් අලහකෝන්ට ද ඇමතුමක් ගත්තේය. එවකට කොළඹ අපරාධ කොට්ඨාසය භාරව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුර සේනානායක සුළු මොහොතක් ඇතුළත දෙහිවල පොලිස් ස්ථානයට පැමිණෙනු ඇති බව රාජපක්ෂ "ද නේෂන්" ප්‍රධාන කර්තෘවරයාට දැනුම් දුන්නේය.

මේ සිද්ධිය පිළිබඳ තමන්ගේ ප්‍රකාශයක් සටහන් කරගන්නා ලෙස ක්‍රිෂාන්ත කුරේ දෙහිවල පොලිස් ස්ථානයේ සිටි ඉහළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිමුත්, ඒ සඳහා අවසර ලැබුණේ නැත. එවකට දෙහිවල පොලිස් ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කළේ රන්ජිත් කොට්ටච්චිය. තනි තීරණයක් නොගත් ඔහු සෑම දේකටම ඉහළින් උපදෙස් පැතුවේය. අනුර සේනානායක එහි ළඟා වූයේ "කවුද මේ මිස්ටර් කුරේ කියන්නෙ" යැයි විමසමිනි. ඉන් අනතුරුව ක්‍රිෂාන්ත සහ අනුර සේනානායක අතර සිදුවූ සංවාදය සෑහෙන උණුසුම් එකක් විය. පැය කිහිපයකට පෙර තමන් සමඟ රාත්‍රී ආහාරය ගත් කීත්ව පැහැර ගැනුම ක්‍රිෂාන්තව වඩාත් නොඉවසුම් කර තිබිණි. ඔහුට අවශ්‍ය වූයේ කෙසේ හෝ හැකි ඉක්මනින් කීත්ව යළි ජීවග්‍රහයෙන් සොයා ගැනීමය. පැහැර ගැනීමක් බව පැහැදිලිව ඇස් පනාපිට පෙනෙන්නට තිබියදී අනුර සේනානායක ඇඟවීමට උත්සාහ කළේ මෙය පැහැර ගැනීමක් නොවන බවය. "පවුලේ ප්‍රශ්නයක් එහෙම තිබුණද" ආදි ඒ මොහොතට කිසිසේත්ම නොගැළපෙන ප්‍රශ්න අසමින් විකාර සහගත රංගනයක නිරත වූ අනුර සේනානායකගේ හැසිරීම ක්‍රිෂාන්ත ඇතුළු පිරිසව තවත් නොසන්සුන් කළේය.

කීත්ව සොයා ගැන්ම වෙනුවෙන් පොලීසියේ උනන්දුව, අඩු බව දුටු ක්‍රිෂාන්ත ඇතුළු පිරිස ඒ වෙනුවෙන් "වෙනම මෙහෙයුමක්" දියත් කළේය. පැහැර ගැනීම දැනගත් මොහොතේ කීත්ගේ ජංගම දුරකථනයට ඇමතුම් ගණනාවක් ක්‍රිෂාන්ත, ලලිත් ඇතුළු හිතවතුන් ගත් මුත් දුරකථනය විසන්ධි කර තිබිණි. කෙසේ වෙතත් දුරකථනයේ ඇති දත්ත පිළිබඳ සොයා බැලීමට පැහැර ගැනීම සිදුකළ එහි මහමොළකරුවන් කිසියම් හෝ අවස්ථාවක එය යළි ක්‍රියාත්මක කරන බව ඔව්හු දැන සිටියෝය. ඒ නිසාවෙන් ඊට නොනවත්වා ඇමතුම් දෙන අතරතුර කෙටි පණිවිඩ කිහිපයක් කීත්ගේ දුරකථනයට යැවීමට ද ක්‍රිෂාන්තලා කටයුතු කරන ලදී. සංඥා හුවමාරු වන කුලුන හරහා දුරකථනය ඇති ප්‍රදේශය සොයා ගැන්ම එහි අරමුණ විය. මේ අතර රිවිර මීඩියා කෝපරේෂන්හි බෙදාහැරීම් කළමනාකරු ගාමිණී නුකුලසේකර තම ජංගම දුරකථනයෙන් කීත්ගේ දුරකථනයට ඇමතුමක් ගත් අවස්ථාවේදී එය නාද වූමුත් එහා කෙළවරින් ප්‍රතිචාරයක් නොලැබිණි. ඒ සමඟ ක්‍රිෂාන්තලා යැවූ කෙටි පණිවිඩ ද කීත්ගේ දුරකථනයට ගමන් කළ බව තහවුරු කරමින් ප්‍රති පණිවිඩ ලැබිණි. ඒ අවස්ථාවේදී ක්‍රිෂාන්ත මෙරට ප්‍රකට ජංගම දුරකථන සේවා සැපයුම්කරුවකු වන සමාගමක ප්‍රධානියාට ඇමතුමක් ගනිමින් උදවුවක් ඉල්ලුවේය. පෞද්ගලික අංශයේ සිටි දක්ෂතම පාලකයකු වූ ඔහු මේ වන විට එම සමාගමේ ආසියානු කලාපයේ රටවල් ගණනාවක් භාර ප්‍රධානියාය. ක්‍රිෂාන්තගේ සමීපතම මිතුරකු වූ හෙතෙම මධ්‍යම රාත්‍රියේ වුවද දුරකථනයට පැමිණියේය. දුෂ්කර තත්ත්වයක් මැද වුවද කීත් සමඟ වාසනාව දිගටම රැඳී සිටි බවට එය සාක්ෂියකි. "මේක ජීවිතයක් පිළිබඳ ප්‍රශ්නයක්. මේ වෙලාවේ මේ උදවුව කරලා දෙන්න" කියමින් අදාළ පණිවිඩ හුවමාරු වූ දුරකථන කුලුන පිළිබඳ විස්තර ලබා දෙන ලෙස ක්‍රිෂාන්ත ඉල්ලා සිටියේය. ප්‍රමාදයකින් තොරව ඉල්ලා සිටි විස්තර ලැබුණු අතර ඒ අනුව දුරකථන සංඥා හුවමාරු වී තිබුණේ දොම්පේ, දෙකටන ප්‍රදේශයේ කුලුනක් හරහාය. එම විස්තර අනුව ක්‍රිෂාන්ත ඇතුළු පිරිස එම

**මෙම පැහැර ගැනීම හා පහරදීම සම්බන්ධයෙන් දැනට අත්අඩංගුවට පත්ව ඇති "කල්ලිය" දෙස බලන විට ඔවුනගේ අවශ්‍යතාවට මේ දේ කළ බවට කිසිසේත්ම අනුමාන කළ නොහැකිය. මේ සමස්ත සිදුවීම් මාලාව දෙස ප්‍රවේශමෙන් බලන විට පෙනී යන වැදගත්ම කාරණය වනුයේ, "බලගතු හස්තයන්" රැසක් මේ පසුපස අනිවාර්යයෙන්ම ඇති බවය.**

ප්‍රදේශය බලා පිටත් විය. පොලීසියෙන් ගමන සඳහා ඒ හැටි සහායක් නොලැබුණ ද එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි සිසිර මෙන්ඩිස් හරහා කුමාරසිංහ නමැති නිලධාරියකුව තමන් සමඟ යෑමට ක්‍රිෂාන්ත එකතු කර ගත්තේය. දොම්පෙ බලා ගියමුත්, එහි විශේෂයෙන් සොයා බැලිය යුතු ස්ථාන පිළිබඳ අදහසක් ක්‍රිෂාන්තලාට නොවීය. ඈත ගම් පීරූ මුත් ඔවුනට හෝඩුවාවක් සොයාගත නොහැකි විය. මේ අතර ක්‍රිෂාන්තලා දොම්පේ බලා පිටත්වූ බව පැහැර ගැනීම සිදුකළ පුද්ගලයන්ට දැනගැන්මට ලැබිණි. මේ වන විට හෙළිව ඇති තොරතුරුවලට අනුව එය ඇතුළින්ම ලැබුණු ටිප් එකක් විය හැකිය. ඒ අනුව වහා "කීත්" ව පැහැර ගැනීම කරන ලද ස්ථානයට ආසන්න ප්‍රදේශයකට ගෙනත් දමන ලෙසට " ඉහළින් අණක්" ලැබිණි. මේ අතර කීත්ව ආපසු ගෙනත් දමා ඇති බව පණිවිඩය ක්‍රිෂාන්තලාට ලැබෙන විට උදෑසන පහ පමණ වී තිබිණි. එම පණිවිඩයත් සමඟ ඉක්මනින්ම දෙහිවල බලා පැමිණි ඔවුන් ඒ වන විට ශාරීරිකව හොඳ තත්ත්වයක නොසිටි කීත්ව කොළඹ ජාතික රෝහලට ඇතුළු කිරීමට කටයුතු කරන ලදී.

පැහැර ගැන්මට ලක්වූ කීත් නෝයාර් යළි පැය කිහිපයකට පසු හමුවූ කථාවේ " ඇතුළත කථාව" එයයි. මේ වන විට හෙළිව ඇති තොරතුරු මත පදනම්ව මෙම අපකීර්තිමත් සිදුවීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත්තේ, මරදාන ට්‍රිපොලි යුද්ධ හමුදා කඳවුරේ පිහිටි බුද්ධි අනු බණ්යකට අයත් භට පිරිසකි. ඔවුන් වෙනුවෙන් යුද හමුදාව නිකුත් කර තිබූ රාජකාරි දුරකථන සම්බන්ධ විශ්ලේෂණයක් සිදුකළ අවස්ථාවේදී හෙළිව ඇත්තේ, කීත් නොයාර් මහතාගේ ජංගම දුරකථනයට සමගාමීව ට්‍රිපොලි කඳවුරේ බුද්ධි අනු බණ්ඩයට අයත් දුරකථන අංක පහක් ගමන් කර ඇති බවය. අතිශය සියුම් ආකාරයට සිදුකරන ලද වැඩිදුර විශ්ලේෂණයන්හිදී හෙළිව ඇත්තේ නොයාර් මහතාගේ මරදානේ පිහිටි කාර්යාලයේ සිට හා ඒ මහතාගේ නිවෙස පිහිටි දෙහිවල වෛද්‍ය පාර අවට ද පැහැර ගැනීමෙන් පසු දොම්පේ දෙකටන ප්‍රදේශයේ ද "ද නේෂන්" හිටපු සම කර්තෘවරයාගේ ජංගම දුරකථනයට සමගාමීව ඉහථ කී දුරකථන අංක පහ ක්‍රියාත්මක වී ඇති බවය. නොයාර් මහතා පැහැරගත් සමයේ එම දුරකථන භාවිත කළ පුද්ගලයන් පිළිබඳ සියලූ විස්තර රහස් පොලීසිය අනතුරුව හෙළි කරගෙන ඇත්තේ ඒවායින් ඇමතුම් ගත් වෙනත් දුරකථන දත්ත පිළිබඳව ද විශ්ලේෂණය කරමිනි. මේ අතර, නොයාර්ව පැහැර ගැනීමට ලක්වූ සමයේ දොම්පෙ බදුවත්ත වලව්ව නම් ස්ථානය යුද හමුදා බුද්ධි අංශයේ පිරිසක් කුලී පදනම මත පරිහරණය කර ඇති බවට ද පරීක්ෂකයන් තොරතුරු අනාවරණය කරගෙන ඇත. එය භාවිත කර ඇත්තේ මරදාන ට්‍රිපොලි හමුදා කඳවුරේ බුද්ධි අනු කණ්ඩය යටතේ රාජකාරි කළ පිරිසක් බව හෙළිව තිබේ. බොහෝ දුරට පැහැර ගැනීමෙන් පසු කීත් නොයාර්ව රැගෙන යන්නට ඇත්තේ එම ස්ථානයට විය හැකිය. මේ අනාවරණය වී ඇති තොරතුරු ලොමුඩැහැගන්වන බව අප මුලින් පැවසූයේ එබැවිනි. මෙම පැහැර ගැනීම හා පහරදීම සම්බන්ධයෙන් දැනට අත්අඩංගුවට පත්ව ඇති "කල්ලිය" දෙස බලන විට ඔවුනගේ අවශ්‍යතාවට මේ දේ කළ බවට කිසිසේත්ම අනුමාන කළ නොහැකිය. මේ සමස්ත සිදුවීම් මාලාව දෙස ප්‍රවේශමෙන් බලන විට පෙනී යන වැදගත්ම කාරණය වනුයේ, "බලගතු හස්තයන්" රැසක් මේ පසුපස අනිවාර්යයෙන්ම ඇති බවය. දැනට මේ සම්බන්ධව අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයන්ගේ දුරකථන දත්ත විශ්ලේෂණයේදී පවා ඒ බව හෙළිව ඇති අතර, හාල්මැස්සන් පමණක් නොව එම තෝරු මෝරු කොටුකර ගැනීමට තරම් ධෛර්යයක් උනන්දුවක් අපරාධ පරීක්ෂකයන්ට තිබිය යුතුය.

**NAATI Translator**
Sinhalese/English
**සිංහල ඉංග්‍රීසි පරිවර්තන**
(Certificates/Documents for Visa matters)
**Nadie Kammallaweera**
Tel: 0481 179 189
Email: nadiekammallaweera@gmail.com